# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍රපීඨය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය 2018

## CMS 2111 - සන්නිවේදන සිද්ධාන්ත

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න | කාලය පැය දෙකයි

---

1. සන්නිවේදන සිද්ධාන්ත පිළිබඳ සම්ප්‍රදයයන් අලළා රොබර්ට් ක්‍රේග් විසින් ප්‍රකාශිත විග්‍රහය හඳුන්වා දී සන්නිවේදනය න්‍යායාත්මක ශික්ෂණයක් ලෙස හැදෑරීමේ දී එය වැදගත් වන ආකාරය විමර්ශනය කරන්න.

*(ලකුණු 20 යි)*

2. 'මාධ්‍ය සන්දේශ සඳහා වන ග්‍රාහක ප්‍රතිචාරයෙහි විවිධත්වය ග්‍රාහකයාට ආවේණික ස්විය ලක්ෂණ රාශියක් මත පදනම් වෙයි.' පුද්ගල විභින්නතා සිද්ධාන්තය (Individual Differences Theory) ඇසුරින් විවරණය කරන්න.

*(ලකුණු 20 යි)*

3. 'වර්තමාන සමාජ දේශපාලන සංකථනය (Socio - Political Discourse) තුළ න්‍යාය පත්‍ර සැකසීමේ ප්‍රමුඛයා බවට ජනමාධ්‍ය පත් ව තිබේ.' යෝග්‍ය උදාහරණ සහිත ව විශ්ලේෂණය කරන්න.

*(ලකුණු 20 යි)*

4. 'පුද්ගල මනස තුළ ප්‍රජානන විෂමත්වය (Cognitive Dissonance) දුරු කොට සංගතභාවය (Consistency) හා සංතුලනය (Balance) ඇති කිරීම සංගතභාවයට අදාළ සිද්ධාන්තවල සාරාර්ථය ලෙස සැලකිය හැකි ය' සන්නිවේදනයේ මනෝවිද්‍යාත්මක ප්‍රවේශ කෙරෙහි සාවධාන ව විග්‍රහ කරන්න.

*(ලකුණු 20 යි)*

*(අනෙක් පිටුවට)*

5. 'සුවිශේෂී සමාජ ආර්ථික හා දේශපාලනික සන්දර්භ තුළ ජනමාධ්‍ය ක්‍රියාත්මක වූ ආකාරය සන්නිවේදනය පිළිබඳ ප්‍රතිමානක සිද්ධාන්ත (Normative Theories) මගින් ප්‍රතියමාන වෙයි.' සාකච්ඡා කරන්න.

*(ලකුණු 20 යි)*

6. පහත සඳහන් සංකල්ප අතරින් **දෙකක් (02)** තෝරාගෙන න්‍යායාත්මක විවරණ සපයන්න.

(අ) පරිතෝෂණය (Gratification)

(ආ) අදහස් වගාකිරීම (Cultivation)

(ඇ) පුද්ගල බලපෑම (Personal Influence)

*(ලකුණු 20 යි)*

7. පහත සඳහන් මාතෘකා අතරින් **හතරක් (04)** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(අ) පර්යේෂණ හා සිද්ධාන්ත (Research and Theory)

(ආ) සන්නිවේදනයේ දෙපියවර ගලනය (Two - step flow of Communication)

(ඇ) මාක්ස්වාදී මාධ්‍ය විචාරය (Marxist Media Criticism)

(ඈ) සමාජ ඉගෙනුම් සිද්ධාන්තය (Social Learning Theory)

(ඉ) ප්‍රචාරණ ක්‍රමෝපාය (Devices of Propaganda)

(ඊ) ලියොන් ෆෙස්ටින්ගර් (Leon Festinger)

*(ලකුණු 20 යි)*